**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------------**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

**-------------------------------------------------**

(අ) ජාතික මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරිමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

(ආ) සියළුම මැතිවරණ කටයුතු එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණවලදී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරි ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.

(ඇ) දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලැසුම් කිරිම, සංවිධානය කිරිම, ක්‍රියාත්මක කිරිම හා අධීක්ෂණය කිරිම.

(ඈ) දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 19 දෙනා සමඟ ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙය විමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරිම.

(ඉ) විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ ආදායම් ගණන්දීමේ නිලධාරින් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරිම, ගිණුම් ගත කිරිම, භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරිම හා අදාල ආදායම් ගණන් දිමේ නිලධාරින් දැනුවත් කිරිම.

(ඊ) දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියළුම රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ දෙපාර්තමේන්තුවල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධිකරණ කටයුතු කිරිම.

(උ) නියඟ, ගංවතුර, සුළිසුළං, මුහුද ගොඩ ගැලිම වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදි රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරිම, ක්‍රියාත්මක කිරිම, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරිම තුළින් ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරිම හා ස්ථාවර කිරිම.

(ඌ) දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු , උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරිමේ කටයුතු සම්බන්ධිකරණය කිරීම.

(එ) දිස්ත්‍රික්කය තුළ විශ්‍රාම වැටුප් වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

------------------------------------------------------------------------

(අ) ගාල්ල කඩවත්සතර
(ආ) තවලම
(ඇ) නියාගම
(ඈ) අම්බලන්ගොඩ
(ඉ) කරන්දෙනිය
(ඊ) ඇල්පිටිය
(උ) නෙළුව
(ඌ) නාගොඩ
(එ) බලපිටිය
(ඒ) හික්කඩුව
(ඔ) අක්මීමන
(ඕ) බෙන්තොට
(ක) හබරාදුව
(ග) බද්දේගම
(ච) යක්කලමුල්ල
(ජ) බෝපේ පෝද්දල
(ට) වැලිවිටිය
(ඩ) ඉමදූව
(න) ගෝනපීනුවල

## 1.3 විගණන විෂය පථය

----------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,075,740,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,067,663,790 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.8,076,210 ක් හෙවත් සියයට 0.75 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 1,014,980,000 | 1,007,601,904 | 7,378,096 | 0.73 |
| මූලධන | 60,760,000 | 60,061,886 | 698,114 | 1.15 |
| එකතුව | 1,075,740,000 | 1,067,663,790 | 8,076,210 | 0.75 |

(ii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ **27** ක් හා දෙපාර්තමේන්තු **19** ක් විසින් එකතුව රු.**4,132,882,906** ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.**2,021,85**7,923 ක් හා රු.**1,935,112,682** ක් වශයෙන් එකතුව රු.**3,956,970,**605 ක් උපයෝජනය කර තිබුණි**.** ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.**164,268,120** ක් හා රු.**13,721,192** ක් වශයෙන් එකතුව රු**. 177,989,312** ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 1 ත් සියයට 23 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාථමික පාසැල් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ ගා/වත්තහේන කනිටු විදුහල සංවර්ධනය කිරිම සඳහා රු.653,793 ක ඇස්තමේන්තුවක් සකස් කර 2013 අගෝස්තු මස වන විට රු.450,000 ක් කොන්ත්‍රාත්කාර සමිතිය වන පාසැල් සංවර්ධන සමිතියට ගෙවා තිබුණි. එහි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- සෙල්ලම් මිදුල සකස් කිරිම සඳහා නගින බහින පිරමීඩයක් සකස් කිරිම, ( ජී.අයි.බට වලින්) සීසෝවක් සැදීම සහ නාම පුවරුවක් සකස් කිරිම සඳහා මිල විශ්ලේෂණ පිළියෙල කර තිබුණි. ඒ සඳහා දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ අදාල නිලධාරින්ගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- නගින බහින පීරමිඩය සඳහා 3/4 ගැල්වනයිස් බට අඟල් 6" කැලි 80 ක් භාවිතා කළ යුතු බවට මිල විශ්ලේෂණයේ සඳහන් කර තිබුණද භාවිතා කර තිබුණේ එම ප්‍රමාණයෙන් කැලි 48 ක් පමණි. ඒ අනුව මෙම මිල විශ්ලේෂණය තුළ සකස් කරන ලද රේටය හා ගෙවීම් කිරිම පිළිබඳව විෂමතාවයක් තිබුණි.

- විෂය අංක 17 යටතේ සීසෝවක් සකස් කර සවි කිරිම සඳහා රු.24,790 ක් ගෙවීම් කර තිබුණද මිල විශ්ලේෂණය පිරිවිතරයන්ට අනුව සකස් කර නොතිබුණි. ගැල්වනයිස් බට අඟල් 1 1/2' -1/9' වෙනුවට පැවතියේ අඟල් 1 1/2', 1/8' 7" ක්වූ අතර අඟල් 1 1/2'- 2/12' පැවතිය යුතු ගැල්වනයිස් බටවල පැවති ප්‍රමාණය අඟල් 1 1/2 2' /8' 10" ක් විය.

**(ආ)　රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු | රු | රු | රු. | රු. |
| 26101 | 52,000,000 | 51,469,721 | 46,000,000 | 49,087,466 | 223,000,000 | 198,076,101 |

විෂය අංක 26101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,014,584 ක් විය.

**(ඇ)　අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමෙහි ශේෂය රු.194,086 ක් විය. 2014 අප්‍රේල් 30 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙම ශේෂය පියවා නොතිබුණි.එය 2006 වර්ෂයේ සිට පැවැත එමින් පැවැතුණි.

**(ඇ)　පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0037/0000/000 දරන තැන්පත් ගිණුමෙහි ශේෂය රු.276,207,075 ක් විය. ඉන් රු.1,054,125 ක තැන්පතු වර්ෂ 2 ක ඉක්මවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6　අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 880, ඇප ආඥා පනතේ 612 අධිකාරය හා 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල 15 ක නිලධාරීන් 47 ක් විසින් එකතුව රු.402,500 ක ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

## 1.7 පාඩු හා හානි

---------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගාල්ලෙහි පිහිටි රජයේ නිවසට 2013 ජුනි 08 දින සුළඟින් වූ හානිය පිළිබඳ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 65 | 60 | 05 |
| තෘතීයික මට්ටම | 43 | 27 | 16 |
| ද්විතීයික මට්ටම | 1,481 | 1,184 | 297 |
| ප්‍රාථමික මට්ටම | 175 | 162 | 13 |
| එකතුව | 1,764 | 1,433 | 331 |